# Abstract No 51

## කාලය පිළිබඳ ජ්‍යෝතිෂ ශාස්ත්‍රීය කියමන

**පූජ්‍ය කුඩාවැවේ සෝමානන්ද හිමි**
කථිකාචාර්ය (ආධුනික), සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය.
somananda.kuda@gmail.com

ජ්‍යෝතිෂය කාලය හා සම්බන්ධිත ශාස්ත්‍රයකි. කාලය මැනීම ජ්‍යෝතිෂ්ශාස්ත්‍රයෙහි මූලික සිද්ධාන්තයකි. ඒ සඳහා සූර්යයාට සුවිශේෂි වැදගත් කමක් හිමිවනු ලැබේ. කාලය රඳා පවතින්නේ සූර්යයා නිසාය. එහෙයින් වරාහමිහිර හිරු හඳුන්වා ඇත්තේ කලාත්ම හෙවත් කාලයාගේ ආත්මය වශයෙනි. සංස්කෘත භාෂාවෙන් රචිත ග්‍රන්ථයන්හි සූර්යයා හඳුන්වා තිබෙන්නේ ත්‍රයිතනු හෙවත් ත්‍රී ආත්ම වශයෙනි. මක් නිසාද යත්, ඔහු තිපරිවට්ට හෙවත් උප්පත්ති, ඨිති සහ භංග (ඇතිවීම, පැවතීම සහ නැවතීම) යන භෞතික සංසිද්ධිය මෙහෙය වන්නා වීම නිසයි. හිරු පමණක් නොව සඳු ද කාලයේ බෙදීමේ ප්‍රධාන වන බව පෙන්වා දිය හැකිය. මහ කවි කාලිදාසයන් ද හිරු සඳු දෙදෙනා යන වදනය වෙනුවට 'යෙ ද්වෙ කාලං විධත්තඃ' (කාලය විධානය කරන දෙදෙනා) යනුවෙන් සඳහන් කරයි. මොවුනගේ කාල විධානය මනුස්සයන් පමණක් නොව ජීවීන් මෙන්ම වෘක්ෂලතා ද හඳුනාගෙන පවතියි. අවුරුදු දින ආදීය බෙදා ගැනීමේ දී චන්ද්‍රයා සහ සූර්යයා වගකීමක් දරන බව ඈත අතීතයේ සිටම හඳුනාගෙන පැවති අතර එය ජ්‍යෝතිෂ ශාස්ත්‍රයෙන් ද සනාථ කර වූවකි. අතීතයේ සිටම මනුස්සයා විවිධ සිදුවීම්හි සාපේක්ෂතා මත කාලය කොටස් කරගෙන තිබේ. ඒ සඳහා අනෙකුත් සත්වයන් ද වෘක්ෂ ලතාවන් යනාදිය උපයෝගි කොටගෙන පවතියි. දවසේ කාලය සෑමවිටම එකිනෙකට වෙනස් බවක් දරයි. උදෑසන, මධ්‍යාහ්නයේ, සැන්දෑවේ සහ මධ්‍යම රාත්‍රීයේ කාලගුණය පැහැදිලිවම දැකිය හැකි වෙනස්කම් වලින් යුක්තය. සැබැවින්ම ජ්‍යෝතිෂය යනු කාලය හා සම්බන්ධ ශාස්ත්‍රයකි. ජ්‍යෝතිෂ්ශාස්ත්‍රයේ පදනම වන කාලය මත පුද්ගයෙකුගේ ත්‍රිදෝෂ තත්වයන් ද වෙනස්වෙයි. මෙම ශාස්ත්‍රයෙහි දැක්වෙන නිවැරදිව කාලය ගණනය කිරීමෙන් සාදාගන්නා වේලාවට අනුව කටයුතු කිරීමෙන් යහපත් සෞඛ්‍යයක් ද ඇතිකර ගැනීමට හැකිවෙයි. පුද්ගලයෙකුගේ උපන් වේලාව මත සකසා ගන්නා ලග්නය, නවාංශකය, නැකත, නැකත් පාදය සහ දශාව ආදිය අන්තර්ගත කේන්ද්‍රය මඟින් ද පුද්ගලයෙකුගේ අතීත, වර්තමාන අනාගත යන කාලත්‍රය සම්බන්ධිත තොරතුරු ප්‍රකාශය කරනු ලැබේ. කේන්ද්‍රයෙහි පළමුවැනි භාවය කිසියම් පුද්ගලයකුගේ ලග්නය වශයෙන් සැලකෙයි. පළමුවැනි භාවය යනු පුද්ගලයකු උපදින වේලාවෙහි නැගෙනහිර දෙසට යොමු වී පැවති භාවයයි. මේ තුලින් පෙනී යන්නේ ජ්‍යෝතිෂය ගැඹුරු හා පුළුල් ශාස්ත්‍රයක් වශයෙනුත් කාලය වූකලී ජ්‍යෝතිෂ්ශාසත්‍රයේ දැක්වෙන මූලික අංගයක් වශයෙනුත් ය. අගක් මුලක් දැකිය නොහැකි කාලය අපිරිමිත දෙයකි. බෞද්ධ ඉගැන්වීම්හි ද කාලය සියළු ජීවයන් ඩැහැගනී. (කාලෝ ඝසති භූතානි) යනුවෙන් දැක්වීමෙන් එය තවදුරටත් සනාථ වන්නේ ය.

**ප්‍රමුඛ පදඃ** ජ්‍යෝතිෂ්ශාස්ත්‍රය, කාලය, වරාහමිහිර, හිරු සඳු, කේන්ද්‍රය